


# දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ ඉල් පුර ජලවක ලත් බුධ දින | කාණ්ඩය 111 | පත්‍රය 287 | පිටු 48 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2020 නොවැම්බර් 18 බදාදා

සාර භූමියේ හර්තානන්දය පැලැස්ස අද පත්‍රය සමඟ




## සමාජයට ප්‍රතිලාභ දෙමින්

# 6%ක ආර්ථික වර්ධනයක් ඉලක්කයයි

## අය-වැය ඉදිරිපත් කරමින් අගමැති කියයි



- රජයේ ආදායම බිලියන 1961
- වියදම බිලියන 3525
- අයවැය හිඟය 9%
- 2021 අපේක්ෂිත ආර්ථික වර්ධ...




- වතු කම්කරු දෛනික වැටුප ජනවාරි 01දා සිට 1000යි
- සමෘද්ධිලාභීන්ට 7% වාර්ෂික පොලියට ණයක්
- දේශීය සමාගම්වලට 50%ක ආදායම් බදු සහනයක්
- කෘෂිකර්ම-සත්ත්ව හා ධීවර ආදායම් බදුවලින් නිදහස්
- සෑම දිස්ත්‍රික්කයකටම නගර විශ්වවිද්‍යාලයක්
- කොවිඩ් රක්ෂණ යෝජනා ක්‍රමයක්
- වෘත්තීය අධ්‍යාපනය ලබන සිසුන්ට 4000ක දීමනාවක්
- සරල බදු ක්‍රමය ඉදිරියටත්
- වීවලට පොහොර නොමිලේ - නෙක් වගාවන්ට කිලෝ 50 රු. 1500ට

ස්වර්ණා විජේකෝන්, නුවන් කොඩිකාර සහ සන්ධ්‍යා කරුණාරත්න

සමාජයේ සියලු පාර්ශ්වවලට ප්‍රතිලාභ ලැබෙන ආකාරයෙන් සියයට 6ක් ඉක්මවන මැදිකාලීන ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීම ඉලක්කය බව අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා 2021 අය-වැය කතාව පාර්ලිමේන්තුව හමුවේ ඉදිරිපත් කරමින් ඊයේ (17) ප්‍රකාශ කළේය.

වාර්ෂික උද්ධමන වේගය සියයට 5ක පවත්වා ගන්නා අතර, ආදායම් හා වියදම අතර, පවත්නා 9ක පමණ වන පරතරය සියයට 4 ... අඩු කර ගැනීම රජයේ අරමුණ බව ... මාත්‍යවරයා පැවසීය.

ජාතික ආදායමෙන් සියයට 90ක් වන රාජ්‍ය ණය සියයට



රාමඤ්ඤ මහා නිකායේ මහානායක

## නාපානේ පේමසිරි මහනාහිමියෝ අපවත් වෙති



අසේල කුරුළුවංශ

ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහානායක අග්ගමහා පණ්ඩිත නාපානේ පේමසිරි මහනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ඊයේ (17) පස්වරුවේ අපවත් වූහ.

ධර්මධර, විනයධර මහා හිමිනමක් වශයෙන් දෙස් විදෙස් බෞද්ධ බැතිමතුන්ගේ ගෞරවාදරයට පාත්‍රව සිටි උන්වහන්සේ අපවත් වූයේ

## අගමැති මහින්දගේ ජන්ම දිනය අදයි



මහින්ද අලුත්ගෙදර

ශ්‍රී ලංකාවේ පස්වන විධායක ජනාධිපති හා වර්තමාන අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ජන්ම දිනය අදට (18) යෙදී තිබේ.දශක තුනකට ආසන්න කාලයක් මෙරට පැවැති ත්‍රස්තවාදය සම්පූර්ණයෙන්ම අවසන් කොට නිදහස් හා සාමකාමී පරිසරයක් උදා කරමින් ජනතාවට නිදහසේ ජීවත් වීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීමෙහිලා නායකත්වය ලබා දීම හේතුවෙන් ඒ මහතා ශ්‍රී ලංකාවේ අති මහත් ජනතාවගේ ජනාදරයට

## ජනපති පදවිප්‍රාප්තියට වසරයි




### විශේෂ අතිරේකය අද දිනමිණ සමඟ

මහින්ද අලුත්ගෙදර

ගෝඨාභය රාජපක්ෂ මහතා මෙරට හත්වැනි විධායක ජනාධිපතිවරයා වශයෙන් දිවුරුම්දී අදට (18) වසරක් සපිරෙයි.

2019 නොවැම්බර් මස 16 වැනිදා පැවැති ජනාධිපතිවරණයට ශ්‍රී ... කළ ගෝඨාභය රාජපක්ෂ මහතා ඡන්ද 6,924,255ක් ලබමින් ජයග්‍රහණය කළේය.

රාජපක්ෂ මහතා ඓතිහාසික අනුරාධපුරයේ රුවන්වැලි මහා සෑ මළුවේදී විධායක ජනාධිපති ධුරයේ දිවුරුම් දුන්නේ මීට වසරකට පෙර